නිපුණතාව 1.5 - ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව කීපයක් හා ඔවුන් ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පහත ආකාරයට දැක්විය හැකිය.

- අයිතිකරුවෝ - ආයෝජන මුදලට ප්‍රමාණවත් ලාභයක් ලැබේ දැයි දැන ගැනීමට
  ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැන ගැනීමට
- කළමනාකරුවෝ - ලාභය උපරිම කිරීමට
  කළමනාකරණ තීරණවල සාර්ථක අසාර්ථක බව දැන ගැනීමට
- සේවකයෝ - ඉහළ වැටුපක් ලබා ගැනීමට,රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට
- ණයහිමියෝ - සපයන ලද ණය මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීමට
  ණය මුදලේ සුරක්ෂිත බව දැන ගැනීමට
- පාරිභෝගිකයෝ - ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීමට
  වගකීම් නිසි පරිදි ඉටු කරන්නේදැයි බැලීමට
- සැපයුම්කරුවෝ - අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට
  සපයන ලද භාණ්ඩ සඳහා මුදල් අයකර ගැනීමට
- විභව ආයෝජකයෝ - අනාගතයේ සම්පත් ආයෝජනයට
- රජය - බදු අයකර ගැනීමට/බදු සහන ලබා දීමට,සේවා නියුක්තිය වර්ධනය
- ප්‍රජාව - පරිසරය සුරැකීම,රැකියා අවස්ථා ලබා ගැනීමට

<u>ක්‍රියාකාරකම</u>

පහත දැක්වෙන ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරන්න.

ඇඳුම් මසා අලෙවි කරන ආයතනයක්,පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක්,ආපන ශාලාවක්,පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවිහලක්

1.ඔබ ප්‍රදේශයේ එවැනි ව්‍යාපාර 4ක් හඳුනා ගන්න.
2.එම ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව වෙන් වෙන්ව හඳුනාගන්න.
3.එම පාර්ශව ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන්නේ මොනවාදැයි දක්වන්න.
4.එම පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට ව්‍යාපාර කටයුතු කළ යුත්තේ කෙසේදැයි පෙන්වා දෙන්න.
5.ව්‍යාපාරය එම පාර්ශව කෙරෙහි සැලකිලිමත් විය යුත්තේ මන්දැයි පැහැදිලි කරන්න.